# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2025

මහනුවර මහා නගර සභාවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට **2025.05.15** දිනට පහත සඳහන් සුදුසුකම් සපුරාලන ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම් :

1.1 *පොදු සුදුසුකම් -*

1.1.1 අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

1.1.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03කට නොඅඩු කාලයක් මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

1.1.3 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

1.1.4 සෑම අයදුම්කරුවකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

1.1.5 2025.05.15 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි අයකු විය යුතු ය. (ඒ අනුව 2000.05.15 දිනට හෝ ඊට පෙර, 1980.05.15 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.2 *අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්.-*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

1.3 *පළපුරුද්ද -*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

*සටහන.-* ඉහත උපාධිය හෝ අනෙකුත් සුදුසුකම් **2025.05.15** දිනට හෝ ඊට පෙර දිනක සපුරා තිබිය යුතු ය.

02. වැටුප් ගෙවීම.-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL 1 - 2025 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

**රු. 82,150 – 10 X 2.400 – 8 X 2,940 – 17 X රු. 3,900 – රු. 195,970/- වේ.**

03. *සේවා කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2 මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි ද අදාළ වේ.

3.3 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.11.18 දිනෙන් අනුමත කර ඇති මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියෙහි සඳහන් කර ඇති හා මින්මතු සිදු කෙරෙන සංශෝධනයන් සඳහා යටත් වනු ඇත.

04. බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියට අනුව ලකුණු පිරිනමා, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

*සටහන* .- සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

05. අයදුම් කිරීමේ ක්‍රමය :

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, "**ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර**" යන ලිපිනයට **2025.08.15** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, නීති නිලධාරි තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා අයදුම්පත් යොමු කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතු ය.

- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි ය.)

06. සියලුම අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා බලා තේරුම්ගත යුතු ය.

07. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

08. මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුජානි ආර්. විජේතුංග,
ලේකම් (*වැ. බ.*),
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

2025 ජුනි මස 24 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.